DOI: 10.31357/fhssmst.2009.00019

# කොළඹ යුගයේ කවිය ඇසුරෙන් සමාජ ස්තරායණය

රිටිගහපොළගේ හංසමාලා උදේනි මැණිකේ
ලේඛනාරූඪ අංකය
GS/HU/2608/2005

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය 2009

# කොළඹ යුගයේ කවිය ඇසුරෙන් සමාජ ස්තරායණය

රිටිගහපොළගේ හංසමාලා උදේනි මැණිකේ

ලේඛ්‍යාරූඪ අංකය

**GS/HU/2608/2005**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා සිංහල

විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය ආචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ සහ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දරගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි.

02.04.2019

දිනය

අත්සන

# උපදේශකවරුන්ගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

උපදේශක අත්සන


ආචාර්ය කඳුලෙගෙදර නාරද හිමි,
අධ්‍යයනාංශ ප්‍රධාන,
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.


දිනය 2009/04/02

උපදේශක අත්සන


ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.


දිනය 2009-4-2


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
03 APR 2009
පශ්චාද් උපාධි පීඨය

# පටුන


| | |
|---|---|
| පටුන | i - ii |
| පූජා | iii |
| අනුමෝදනා | iv - v |
| නිබන්ධ සාරාංශය | vi - vii |
| සංකේත නිරූපණ | viii - ix |
| පළමු වැනි පරිච්ඡේදය | |
| **හැඳින්වීම** | 01 - 01 |
| 01. 01. ප්‍රවේශය | 01 - 04 |
| 01. 02. කොළඹ කවිය පිළිබඳ පර්යේෂණ | 05 - 25 |
| 01. 03. පර්යේෂණයේ අරමුණු | 25 - 28 |
| 01. 04. පර්යේෂණයේ පරමාර්ථ | 28 - 28 |
| 01. 05. පර්යේෂණ ක්‍රමවේදය | 28 - 30 |
| 01. 06. විෂය සීමාව | 30 - 34 |
| **දෙ වැනි පරිච්ඡේදය** | |
| කොළඹ කවිය හා සමාජ ස්තරායණය | 35 - 35 |
| 02. 01. ප්‍රවේශය | 35 - 36 |
| 02. 02. සිංහල සාහිත්‍යයේ යුග බෙදීමේ පදනම | 36 - 40 |
| 02. 03. කොළඹ යුගය | 40 - 42 |
| 02. 04. කොළඹ සමාජ පෙරළිය | 42 - 51 |
| 02. 05. කොළඹ සාහිත්‍ය ප්‍රවණතා | 51 - 58 |
| 02. 06. කොළඹ කවිය | 58 - 61 |

02. 07. සමාජ ස්තරායණ සාධක 61 - 72

02. 08. ශ්‍රී ලංකා සමාජයෙහි ස්තරායණ සාධක 72 - 74

**තෙ වැනි පරිච්ඡේදය**

ආවෘත සමාජය හා ස්ත්‍රී - පුරුෂ, වර්ණ - වර්ග, කුල ස්තරායණය 75 - 75

03 . 01 ආවෘත සමාජය 76 - 77

03. 02. ස්ත්‍රී - පුරුෂ ස්තරායණය 77 - 121

03. 03. කුල ස්තරායණය 121 - 142

03. 04. වර්ණ - වර්ග ස්තරායණය 142 - 173

**සිව් වැනි පරිච්ඡේදය**

විවෘත සමාජය හා පංති ස්තරායණය 174 - 174

04 . 01. විවෘත සමාජය 174 - 176

04 . 02. පංති ස්තරායණය 176 - 192

04 . 03. වෛශ්‍යා වෘත්තිය 192 - 206

04. 04. යාචක වෘත්තිය 207 - 215

04. 05. ගොවි වෘත්තිය 216 - 222

04. 06. කම්කරු වෘත්තිය 223 - 243

04. 07. වෙනත් රැකියා 243 - 252

සමෝධානය 253 - 258

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 259 - 276

Bibliography 276 - 279

සූචිය 280 - 283

පාරිභාෂික ශබ්ද මාලාව 284 - 288

# පූජා

සිඳ බිඳ රැඳුණු හද ගනඳුර සතපා    න
මඳ හස මුවග රඳවා සිත සනසා    න
අදහස දිනනු මිස අන් දෑ නො සිතා    න
ඔද වැඩි සිතින් ඔවදන් දුන් සුපසා    න

වැර සිඳි විට දි සිත ළඟ මහමෙරක් වෙ    ත
නිරුදක දිවි කතර සිහිලැල් දිය ඉසි    ත
මුදු මඳ පවන වී දුකඳුරු ගිම් නිව    ත
සකිසඳ නුඹ ම මිස සිටිනුද අන් කෙව    ත

# අනුමෝදනා

පර්යේෂණ ක්‍රමවේදය මුලකුරෙහි පටන් කියා දෙමින් ද නිබන්ධයෙහි අඩු ලුහුඬුකම් නිරන්තර ව පෙන්වා දෙමින් ද සදොස් තැන් නිදොස් කරමින් ද වෘත්තීය වගකීම් රාශියක් මධ්‍යයෙහි වුව නො මසුරු ව සදුපදේශ ලබා දුන්නාහු අප අධ්‍යයනාංශයේ අංශාධිපති තැන්පත් රාජකීය පණ්ඩිත පූජ්‍යපාද ආචාර්ය කිවුලේගෙදර නාරද ස්වාමීන්වහන්සේ ය.

පර්යේෂණ මාතෘකාව සපයා දෙමින් ද අනේකවිධ ගුරුහරුකම් ලබා දෙමින් ද අධ්‍යයනයට අවශ්‍ය පතපොත සපයා දෙමින් ද බැදිවල මංමුලා වන්නට ඉඩ නො දී මඟ හසර පාදා දුන්නාහු සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ඇදුරුතුමාණෝ ය.

සමස්ත පර්යේෂණ කාර්යය පුරා අප්‍රමාණ සහයක් ලබා දුන්නාහු අප අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්නයෝ ය.

ආරම්භක අවස්ථාවේ සිට මේ දක්වා ම අධ්‍යයනාංශයේ ඇතැම් කටයුතුවලින් මා නිදහස් කරමින් ද සපයා ගත නො හැකි වූ දුර්ලභ කවි සඟරා ආදිය සපයා දෙමින් මවක ලෙස නිබඳ රැඳුණාහු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල ගුරු මෑණියෝ ය.

තොරතුරු සම්පාදනයෙහි ලා ඇතැම් දුෂ්කර අවස්ථාවන්හි සෙනෙහෙ සිත් පෙරදැරි ව පිළිසරණ වූවාහු භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ගුරු පියාණෝ ය.

එම සත් පුරුෂ කැළ මෙන් ම පරිවර්තන කාර්යයෙහි දී සහය වූ ශකිලා පෙරමුණ හිතාදර මිතුරිය ද නිරතුරු ව මා දිරිමත් කළ කථිකාචාර්ය නාවලපිටියේ අනුරාධා මෙහෙණින්වහන්සේ ද මෙහි දී සිහිපත් කළ යුතු ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ හා ජාතික කෞතුකාගාර පුස්තකාලයේ කාර්ය මණ්ඩල ලබා දුන් අනුග්‍රහය ද සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගයාත්‍රි හා රාජා අයියා ලබා දුන් උදව් ද අපමණ ය.

උකටලී ව සිත රිදවා ගත් සෑම මොහොතක දී ම මා ළඟ රැඳෙමින් මට ශක්තියක් වූයේ ළබැඳි මනෝ අක්කා සහ තනූ ය.

අපේක්ෂිත ව්‍යායාමය සඵල කර ගත නො හැකි වේ යැයි සිතා ම විසින් පවසන ලද සියලු අමිහිරි වදන් සම සිතින් දරමින් එදා මෙන් අදත් නො වෙනස් වන සෙනෙහසේ මහෝඝය ආදරණීය අම්මා ය. ඇ නො සිටින්නට මෙකී කර්තව්‍යය අතිශය දුෂ්කර වන්නට තිබිණි. අද අප අතර නැතත් මා දිවියේ උත්තරීතර පහන්ටැඹ වී මඟ පෙන්වූ ආදරණීය තාත්තා ද බැති සිතින් සිහිපත් කරමි.

සියලු සුබ විහරණ පසෙක තබා මා වෙනුවෙන් ඇතැම් කාල පරිච්ඡේදවල දුක ම අනුභව කරමින් සමීපයේ රැඳුණාහු මගේ අයියා, මල්ලිකා අක්කා හා දයාබර මලණුවෝ ය.

මගේ සියලු නො කටයුතුකම් ඉවසා දරාගෙන විටෙක නො විතර සෙනෙහසින් ද තවත් විටෙක කෝපයෙන් හා සදය උපහාසයෙන් ද යුතු ව අවවාද අනුශාසනා දෙමින් මාගේ අභිවෘද්ධිය ම පැතුවේ 'ඔබ' ය. 'ඔබ' නො වන්නට මෙකී සමස්ත කර්තව්‍යය ම සිහිනයක් ම වනු නො අනුමාන ය.

# නිබන්ධ සාරාංශය


මෙහි දී සිදු කෙරනුයේ අපගේ අධ්‍යයන අන්තර්ගතය සම්පිණ්ඩනය කර දැක්වීමය. හැඳින්වීම යන සිරස්තලය යටතේ පර්යේෂණ ක්ෂේත්‍රයේ ස්වරූපය හා ස්වභාවය පෙන්වා දීමත් අධ්‍යයන අරමුණු හා එහි වැදගත්කම පහදා දීමත් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ විස්තර කිරීමත් සිදු කෙරේ.

මෙහි දෙ වැනි පරිච්ඡේදය සිංහල සාහිත්‍යයේ යුග බෙදීමේ පදනම ද ඒ අනු ව රාජධානි කේන්ද්‍ර කර ගනිමින් බිහි වූ කොළඹ යුගයේ 'කොළඹ' නාම ගැන්වීම පිළිබඳ ව ද අනෙක් රාජධානීවලට සාපේක්ෂ ව කොළඹ යුගයේ සිදු වූ ආර්ථික, සාමාජික, දේශපාලනික හා සංස්කෘතික පෙරළිය පිළිබඳ ව ද එම නව පසුබිම මත බිහි වන මෙකී යුගය කේන්ද්‍ර කර ගත් සාහිත්‍ය ප්‍රවණතා කවරේ ද? හා කොළඹ කවිය යනු කවරක් ද? යනාදිය සාකච්ඡා කිරීම සඳහාත් වෙන් වේ. එමෙන්ම සමාජ ස්තරායණය යන සංකල්පය විග්‍රහ කිරීමත් එහි මූලික ලක්ෂණ හා ප්‍රධාන මානයන් හඳුනා ගැනීමටත් අවධානය යොමු කෙරේ.

සමාජ ස්තරායණය නම් සංකල්පයට අනුව සමාජ වර්ගීකරණයේ ආවෘත සමාජ යටතේ පුද්ගලයාගේ උපතට සාපේක්ෂව ජන්මයෙන් තීරණය වන ලක්ෂණයන් වූ ස්ත්‍රී - පුරුෂ භේදය, වර්ණ - වර්ග භේදය, හා කුලය යන ලක්ෂණ කොළඹ කවිය තුළ නිරූපණය වන අන්දම තෙ වැනි පරිච්ඡේදයෙන් විමසා බැලේ. එහි දී ඒ එක් එක් ස්තරායණ මාන පිළිබඳ ව සාකච්ඡා කිරීමත් ශ්‍රී ලාංකේය සමාජය තුළ එය ව්‍යාප්තවූ අයුරුත් සාකච්ඡා වේ.

පුද්ගලයාගේ ජන්මයෙන් හෝ හැකියාව මත තීරණය විය හැකි පංති සාධකය විවෘත ගණයේ සමාජයක ලක්ෂණයක් වන අතර එය සාධිත තත්ත්වයකි. මෙකී පංති ක්‍රමය කොළඹ කවියට පසුබිම් වූ අයුරුත් ඒ ඔස්සේ එවක සාමාජික වටපිටාව විමර්ශනය කිරීම සඳහාත් එකී පංති ක්‍රමය සඳහා කවීන් දැක් වූ ප්‍රතිචාර කෙබඳු ආකාරයක් ගත්තේද යන්නත් අධ්‍යයනය කිරීම සිව් වැනි පරිච්ඡේදයෙන් අපේක්ෂිත ය. මෙහි දී ද ප්‍රධාන වශයෙන් පංති ස්තරායණය පිළිබඳ සාකච්ඡාවට ලක් වන අතර ඉන් අනතුරුව එහි මූලික අවස්ථා ගැන ද අවධානය යොමු කෙරේ.

මෙහි දී විස්තරාත්මක ව සමාජ විද්‍යාත්මක සංකල්ප පිළිබඳ ව ද ඒ එක් එක් පරිච්ඡේදයන් යටතේ දී සාකච්ඡා කෙරේ.

මෙම අධ්‍යයනය තුළින් විමර්ශනයට ලක් කළ ක්ෂේත්‍රය තුළින් අනාවරණය වූ කරුණු අනුව එළඹුණු නිගමන ද සමස්ත අධ්‍යයනය පිළිබඳ ව වූ සමාලෝචනයක් හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් අවසානයේ දී ඉදිරිපත් කරනු ලැබේ.

# සංකේත නිරූපණ

| | | |
|---|---|---|
| අ. ක. | - | අන්ධ කවියා |
| ආදර. | - | ආදරය |
| ආ. සම්. | - | ආනන්ද සම්ප්‍රවේදිතය |
| ඉ. කො. | - | ඉරුණු කොඩිය |
| එ. හෙ | - | එදා හෙළ දිව |
| කපි. 2 | - | කපිල කවි 2 |
| කපි. 3 | - | කපිල කවි 3 |
| කලා. පරි. | - | කලාත්මක පරිකල්පනය |
| කා. බු. | - | කාන්තාව සහ බුදු සමය |
| කුල. සමා. | - | කුලය, පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම් |
| කු. පැදි. | - | කුමරතුඟු පැදි එකතුව |
| කේයස්. | - | කේයස් නිර්මාණ ප්‍රවේශය |
| කො. සං. | - | කොළඹ නාගරික සභා ශත සංවත්සර පුස්තකය |
| ග. ලං. | - | ගයිගර් දුටු ලංකාව |
| ජන්ම. | - | ජන්ම භූමිය |
| ජානු. | - | ජාත්‍යනුරාගය |
| ජී. එච්. | - | ජී. එච්. පෙරේරා කාව්‍ය සංග්‍රහය |
| ඩේවි. | - | ඩේවි දුටු ලංකාව |
| ඩොයිලි. | - | ඩොයිලිගේ දිනපොත |
| දර්. කා. | - | දර්ශනය සහ කාන්තාව |
| ධන. | - | ධනය |
| නු. පී. බී. | - | නුදුටු පී.බී. කිවියාව |
| නූ. කා. | - | නූතන කාව්‍ය විමර්ශන - ලේඛන (ප්‍රථම භාගය) |
| නූ. සිං. ක. | - | නූතන සිංහල කවිය විචාරය හා රසාස්වාදය |
| නූ.සිං. කා. 1 | - | නූතන සිංහල කාව්‍යය 1 |
| නූ. සිං. කා. 2 | - | නූතන සිංහල කාව්‍යය 2 |
| නූ. සිං. සා. | - | නූතන සිංහල සාහිත්‍යය |
| නො. ගී. | - | නො ගයන ගීතය |
| පැ. ල. | - | පැරණි ලක්දිව කාන්තාව |
| පිය. සිරි. 1 | - | පියදාස සිරිසේනගේ නවකථා එකතුව 1 වන කාණ්ඩය |
| පිය. සිරි. 2 | - | පියදාස සිරිසේනගේ නවකථා එකතුව 2 වන කාණ්ඩය |

| | | |
|---|---|---|
| පිය. සිරි. 4 | - | පියදාස සිරිසේනගේ නවකථා එකතුව 4 වන කාණ්ඩය |
| පිය. සිරි. කා. නි. | - | පියදාස සිරිසේනගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| පෙ. බු. | - | පෙණ බුබුලු (මිහිර) |
| මන්. පන්. | - | මන් බැඳි පන්හිඳ - එච්. එම්. කුඩලිගම |
| ම. ප්‍ර. | - | මහින්ද ප්‍රබන්ධ |
| මා. වි. | - | මානව විද්‍යාව |
| ර. මි. | - | රස මියුර - මානවසිංහ සාහිත්‍යය |
| ලං. ජන. | - | ලංකා ජනතාව |
| ලං. සමා. | - | ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය |
| විම. කුමා. | - | විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි |
| වි. ත. | - | විසිවුණු තරු |
| වේද. | - | වේදනාව |
| ශ්‍රී ලං. ජන. | - | ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අරගලයේ ජීව විද්‍යාත්මක පසුබිම |
| ශ්‍රී ලං. සමා. | - | ශ්‍රී ලංකා සමාජය |
| ස්ත්‍රී - පුරුෂ සමා. | - | ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා පවුල |
| ස. ස්. | - | සමාජ ස්තරායණය |
| ස. සං. | - | සමාජ විද්‍යාවේ මූලික සංකල්ප |
| ස. සිද්. | - | සමාජ විද්‍යාව සිද්ධාන්ත සහ විධික්‍රම |
| ස. වි. | - | සමාජ විද්‍යාව |
| ස. වි. න්‍යා. | - | සමාජ විද්‍යාව - මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේදය |
| සිං. කවි. රසා. | - | සිංහල කවිය විචාරය හා රසාස්වාදය |
| සිං. කා. සම්. | - | සිංහල කාව්‍ය සම්ප්‍රදාය |
| සිං. ගැ. | - | සිංහල ගැහැනිය |
| සිං. සමා. | - | සිංහල සමාජ සංවිධානය |
| සිං. සා. ප්‍ර. | - | සිංහල සාහිත්‍ය ප්‍රවේශය |
| සිං. සා. | - | සිංහල සාහිත්‍ය වංශය |
| සු. මැ. | - | සුදු මැණිකේ |
| සු. වි. | - | සුවඳ විලවුන් |
| සො. බි. | - | සොහොන්බිම |

# පළමු වැනි පරිච්ඡේදය

## හැඳින්වීම

සිංහල පද්‍ය කාව්‍ය වංශයෙහි එක් කාල පරිච්ඡේදයක් වූ කොළඹ යුගයෙහි කාව්‍ය නිර්මාණවල දෘශ්‍යමාන වන සමාජ ස්තරායණය නම් වූ සමාජ විද්‍යාත්මක සංකල්පය විමර්ශනය කිරීම මෙම නිබන්ධයෙහි අභිප්‍රේතාර්ථය වේ. මේ පරිච්ඡේදයෙහි අරමුණ වන්නේ එම පර්යේෂණ ක්ෂේත්‍රයේ ස්වරූපය හා ස්වභාවය පෙන්වා දීමත් අධ්‍යයන අරමුණු හා එහි කාලීන වැදගත්කම පහදා දීමත් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ විස්තර කිරීමත් පර්යේෂණ නිබන්ධයේ අපේක්ෂිත සැලැස්ම විස්තර කිරීමත් ය.

### 01. 01. ප්‍රවේශය

කොළඹ යුගය නම් කාල පරිච්ඡේදයෙහි ආරම්භය පිළිබඳ ව විවිධ පුද්ගලයන් විවිධ මතවාද ඉදිරිපත් කර ඇත. කොළඹ යුගයේ සාහිත්‍යය, නූතන සාහිත්‍යය ලෙස ද හඳුන්වනු ලැබේ.[1] කොළඹ යුගයෙහි ඇත ඉම ලෙස සැලකිය හැකි වන්නේ ක්‍රි. ව. 1815 ය. ඒ, කොළඹ අගනුවර කොට ගත් පාලන කාලයක් එළඹෙන්නේ එකී වර්ෂයෙන් පසුව වන නිසා ය. එහෙයින් පර්යේෂණයේ පහසුව පිණිස මෙම කාල වකවානුව හැඳින්වීමට ව්‍යවහාරයේ පවතින "කොළඹ යුගය" යන යෙදුම ම මෙම නිබන්ධය සඳහා ද යොදා ගනු ලබන්නේ ය. එතැන් සිට ප්‍රාරබ්ධ කොළඹ යුගයේ සුවිශේෂී ම සාහිත්‍යාංගය වන්නේ 'කොළඹ කවිය' යි. මෙසේ කොළඹ කාව්‍ය යුගය සේ ම කොළඹ කාව්‍ය පරපුර ද ආරම්භ වූයේ ය.

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි ආදී යුගවල සාහිත්‍යය ආරම්භ වන්නේ ඒ එක් එක් යුගයක් අවසාන වීමෙන් පසුව එම රාජධානිය බිඳ වැටීමෙන් අනතුරු ව ය. ඒ අනු ව අනුරාධපුර රාජධානිය බිඳ වැටීම නිසා පොළොන්නරු යුගය ආරම්භ වේ. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමඟ දඹදෙණි යුගය ආරම්භ වේ. මෙසේ රාජධානි නිරිතදිගට සංක්‍රමණය වූ අතර එම රාජධානි බිඳ වැටීම සහ ගොඩ නැඟීම අනු ව සාහිත්‍ය යුගවල ආරම්භය හා

[1] සන්නස්ගල, , පුංචි බණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1964, පි.

අවසානයත් සිදු විය. මෙකී ක්‍රියා පටිපාටිය වෙනස් වනුයේ කොළඹ යුගයේ දී ය. මන්ද යත් එහි ආරම්භය පිළිබඳ ව මෙන් ම අවසානය පිළිබඳව ද විවිධාකාර මතභේද දැනුදු උද්ගත ව පවතින බැවිනි.

විද්වතුන් මේ පිළිබඳව පළ කරන මත කිහිපයක් මෙබඳු වේ.

(i) සිංහල විශ්ව කෝෂයට අනුව කොළඹ යුගය යනු ක්‍රි. ව. 1815 සිට වර්තමානය දක්වා කාල පරිච්ඡේදය යි.[1]

(ii) පුංචි බණ්ඩාර සන්නස්ගල කොළඹ කාලය වශයෙන් හඳුන්වන්නේ ක්‍රි. ව. 1815 සිට 1960 දක්වා කාලය යි.[2]

(iii) නූතන කවිය පිළිබඳ ව සාකච්ඡා කරන ආරිය රාජකරුණා ඊට අදාළ කාල පරිච්ඡේදය ලෙස දක්වන්නේ ක්‍රි. ව. 1850 - 1960 ත් අතර කාලය යි.[3]

(iv) නූතන කවිය පිළිබඳ ව කථා කරන ගුණදාස අමරසේකර සිංහල කවියෙහි අද්‍යතන යුගය ලෙස සලකන්නේ විසි වැනි සියවසේ මුල සිට අද දක්වා ලියැ වී ඇති කාව්‍ය වංශය යි.[4]

(v) පී. මලල්ගොඩ කවියා විසිවන සියවසේ ආරම්භයත් සමඟ උදා වෙන යුගය කොළඹ යුගය ලෙස හඳුන්වයි.[5]

(vi) ආනන්ද ඩබ්. පී. ගුරුගේ ගේ  මතය වී ඇත්තේ මාතර යුගයෙන් පසු කාලය නූතන යුගය ලෙස සැලකෙන බව යි.[6]

උක්ත විද්වතුන්ගේ මති මතාන්තර විස්තරාත්මක ව මතු දැක්වෙනු ලැබේ.

ක්‍රි. ව. 1815 - 1960 දක්වා කාලය ලංකා ඉතිහාසයේ කොළඹ යුගය වශයෙන් නම් ගැන්විය යුතු බව පවසන පුංචි බණ්ඩාර සන්නස්ගල එම යුගයේ රචිත මුල් ම කෘතිය ලෙස රාජාවලිය 11 හඳුන්වා දී ඇත.[1]

---

[1] "කොළඹ යුගය" **සිංහල විශ්වකෝෂය** - 8 වැනි කාණ්ඩය,සංස්.කේ. එන්. ඕ.ධර්මදාස, කොළඹ, 341 පි.
[2] **සිං. සා.** 510 පි.
[3] රාජකරුණා, ආරිය, **නූතන සිංහල කාව්‍යය-2**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004, 190 201 පිටු.
[4] අමරසේකර, ගුණදාස, **සිංහල කාව්‍ය සම්ප්‍රදාය**, විසිදුනු ප්‍රකාශනයෝ, බොරලැස්ගමුව, 1998, 170 පි.
[5] **කොළඹ කවි යුගය,** සංස්. පී. මලල්ගොඩ, සමස්ත ලංකා සිංහල කවි සම්මේලනය, පිළියන්දල, 1981, පෙරවදන
[6] ගුරුගේ, ආනන්ද ඩබ්. පී. **සිංහල සාහිත්‍ය ප්‍රවේශය**,ස්වස්තික යන්ත්‍රාලයය,කොළඹ, 1964, 252 පි.